# 3. රජය හා ව්‍යාපාර, පාරිභෝගික ආරක්ෂණය

## රජය හා ව්‍යාපාර අතර අන්තර් ක්‍රියාකාරිත්වය

රජය හා ව්‍යාපාරයන් යන දෙපාර්ශවයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා දෙපාර්ශවය අතර එකිනෙකාට සහය වන අන්තර් ක්‍රියාකාරිත්වයක් පැවතිය යුතුය. එය දෙපාර්ශවයේම වර්ධනයටත් සමස්ත ආර්ථිකයේම සංවර්ධනයටත් වැදගත් වේ.

| රජයේ ආර්ථික අරමුණු | ව්‍යාපාරවල දායකත්වය |
|---|---|
| • ආර්ථික සංවර්ධනය<br>• ආර්ථික වෘද්ධිය<br>• පූර්ණ සේවා නියුක්තිය<br>• සාධාරණ ආදායම් ව්‍යාප්තිය<br>• ආර්ථික කාර්යක්ෂමතාව<br>• මිල ස්ථායිතාවය<br>• බාහිර ස්ථායිතාවය<br>• පාරිසරික ගුණාත්මකභාවය<br>• ආර්ථික නිදහස<br>• ආර්ථික සුරක්ෂිතතාව | • නිසි පරිදි බදු ගෙවීමද<br>• දේශීය සම්පත් භාවිතය<br>• රැකියා අවස්ථා සැපයීම<br>• නීතිරීති හා ප්‍රතිපත්ති පිළිපැදීම<br>• විදේශ විනිමය ඉපැයීම<br>• පරිසරයට හානි නොකිරීම<br>• සමාජ සුබසාධනයට දායක වීම<br>• යටිතල පහසුකම් ව්‍යාපෘතිවලට දායකවීම |

| ව්‍යාපාර ප්‍රගතියට රජයේ දායකත්වය | රජය ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන ආකාරය |
|---|---|
| • යටිතල පහසුකම් සපයාදීම<br>• බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම<br>• දිරිගැන්වීම ලබා දීම<br>• ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීම<br>• නීතිරීති හා අණපනත් හඳුන්වාදීම<br>• විදේශ විනිමය පහසුකම් සැපයීම<br>• ඍජු ලෙස මැදිහත් වීම | • යටිතල පහසුකම් සපයන්නෙකු ලෙස<br>• ප්‍රතිපත්ති සම්පාදකයෙකු ලෙස<br>• නියාමකයෙකු ලෙස<br>• ගණුදෙනුකරුවෙකු ලෙස<br>• දිරිගැන්වීම් සපයන්නෙකු ලෙස<br>• බදු අයකරන්නෙකු ලෙස<br>• තරගකරුවෙකු ලෙස |

## ලෝකයේ ඕනෑම රටක රජය සකස් වන ව්‍යුහය

- විධායකය
- ව්‍යවස්ථාදායකය
- අධිකරණය

- ශ්‍රී ලංකාවේ රජය නියෝජනය කරන පරිපාලන ස්ථර (ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කෙරෙහි රජය බලපෑම් තුන් ආකාරයකින් සිදු වේ)
  - මධ්‍යම රජය
  - පලාත් සභා
  - පලාත් පාලන ආයතන

**රජය ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කිරීමට හේතු**

- පොදු භාණ්ඩ සැපයීමට
- සුඛසාධන භාණ්ඩ සැපයීමට
- පෞද්ගලික අංශයේ ව්‍යාපාර වැඩි දියුණු කිරීමට
- පෞද්ගලික අංශය තුළ ඒකාධිඒකාධිකාරිත්වයක් ඇති වීම වළක්වාලීමට
- පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමට
- යටිතල පහසුකම් සැපයීමට

- රජයක් ව්‍යාපාර කටයුතු සඳහා මැදිහත් වන ප්‍රමාණය තීරණය කරන මූලික නිර්ණායකය
  - ➢ අර්ථ ක්‍රමය
    - ධනවාදී අර්ථ ක්‍රමයක් තුළ රජයේ මැදිහත්වීම පහළ මට්ටමක පවතී.
    - සමාජවාදී අර්ථක්‍රමයක් තුළ රජයේ මැදිහත් වීම ඉහළ මට්ටමක පවතී.

## ආර්ථික ප්‍රතිපත්ති

- රජයක් සතුව පවතින ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා රජය විසින් භාවිතා කරන විවිධ උපකරණ මෙලෙස හඳුන්වයි.

| මූල්‍ය ප්‍රතිපත්තිය | ෆිස්කල් ප්‍රතිපත්තිය (අයවැය ප්‍රතිපත්තිය, බදු ප්‍රතිපත්තිය) |
|---|---|
| • රටක මුදල් සැපයුමට බලපෑම් කරනු ලබන ආර්ථික ප්‍රතිපත්තිය (ප්‍රසාරණාත්මකව හෝ සංකෝචනාත්මකව)<br><br>• අරමුණ<br>රටේ සමස්ත මිල මට්ටම ස්ථාවරව රඳවා ගැනීම<br>(මෙය දීර්ඝ කාලයක් පුරා සිදු වේ නම් ආර්ථිකය තුළ උද්ධමනය පිටු දැකිය හැකිය.)<br><br>• ක්‍රියාත්මක කිරීම<br>ශ්‍රී ලංකා මහ බැංකුව<br><br>• උපකරණ<br>පොලී අනුපාතය<br>ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය<br>විවට/ විවෘත වෙළඳපොල කටයුතු<br>ණය පිළිබඳ සීම හා කොන්දේසි යහ පෙළඹවීම/ ශිෂ්ඨ ප්‍රයෝග<br>ප්‍රතිමූල්‍ය පහසුකම් | • ෆිස්කල් ප්‍රතිපත්තිය<br>රාජ්‍ය ආදායමට හා වියදමට බලපෑම් කරනු ලබන ආර්ථික ප්‍රතිපත්තිය<br><br>• අරමුණ<br>සාර්ව ආර්ථික ස්ථායිතාව ඇතිකිරීම<br><br>• ක්‍රියාත්මක කිරීම<br>මහා භාණ්ඩාගාරය/ මුදල් අමාත්‍යාංශය<br><br>• උපකරණ<br>රාජ්‍ය වියදම<br>රාජ්‍ය ණය<br>බදුකරණය |

✓ ණය පිළිබද සීමා හා කොන්දේසි පැනවීමේ අරමුණු

- උද්ධමනය පාලනය කිරීම
- මුදල් සැපයුම පාලනය කිරීම
- විවිධ ක්ෂේත්‍ර වෙත ණය ලබා දීමෙන් ධෛර්යමත් කිරීම

✓ උද්ධමනය

උද්ධමනය යනු රටේ පොදු මිල මට්ටමේ සිදුවන අඛණ්ඩ වර්ධනයයි.

✓ මුදල් සැපයුම
මුදල් සැපයුම යනු නිශ්චිත කාල පරිච්ඡේදයකදී රටේ ජනතාව අතර සංසරණය වන මුදල් ප්‍රමාණයයි.

✓ ප්‍රමාණාත්මක උපකරණ (දැනට මූල්‍ය ප්‍රතිපත්තිය තුළ සක්‍රීයව පවතින මූල්‍ය උපකරණ)

- ප්‍රතිපත්තිමය පොලී අනුපාත
- ව්‍යවස්ථාපිත සංචිත අනුපාත
- විවට වෙළඳපොළ කටයුතු

✓ ප්‍රමාණාත්මක නොවන උපකරණ

- යහ පෙළඹවීම
- බැංකුණය පාලනය
- ණයවර ලිපි කාසි ආන්තික නියම කිරීම

✓ ප්‍රතිපත්තිමය පොලී අනුපාත
මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා මහබැංකුව විසින් භාවිතා කරන පොලී අනුපාතයන් වේ.

✓ මහබැංකු පොලී අනුපාතිකය

- නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය
- නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය

✓ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය

වාණිජ බැංකු විසින් තම රුපියල් තැන්පතු වගකීම්වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් තැන්පතුවක් ලෙස පවත්වා ගත යුතු ප්‍රමාණය දැක්වෙන අනුපාතයයි.

✓ විවට වෙළෙඳපොල කටයුතු

වෙළෙඳපොල ද්‍රවශීලතාව පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ
බැංකුව මගින් පිළිගතහැකි සුරැකුම්පත් යොදා ගැනීම මගින් ක්‍රියාත්මක කරනු ලබන
වෙළඳපොල පදනම් කරගත් මූල්‍යය ක්‍රියාකාරකම්ය.

- ✓ විවට වෙළෙඳපොල කටයුතුවල පරමාර්ථ 02කි.
    - පොලී අනුපාතය උපරිම හා අවම මට්ටමක රඳවා ගැනීම
    - වාණිජ කටයුතු වල ව්‍යවහාර මුදල් සංචිත වෙනස් කොට මුදල් සැපයුම කෙරෙහි බලපෑමක් ඇතිකිරීම.
- ✓ මහ බැංකුව සුරැකුම්පත් විකිණීමේදී රටේ මුදල් සැපයුම සංකෝචනය වේ.
- ✓ මහ බැංකුව සුරැකුම්පත් මිලට ගැනීමේදී රටේ මුදල් සැපයුම ප්‍රසාරණය වේ.

✓ යහ පෙළඹවීම්
මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් වාණිජ බැංකු ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ව
ඔවුන් දැනුවත් කොට ඒ සඳහා යොමු කිරීමට මහ බැංකුව විසින් කරනු ලබන
පෙළඹවීමයි.

✓ බැංකු ණයපාලනය
ණයසීමා පැනවීම ප්‍රමාණාත්මක හා ගුණාත්මක ස්වරූපයෙන් සිදු කරයි.

## රාජ්‍ය ආදායම

රජයක් මුදල් වර්ෂයක් තුළ විවිධ ප්‍රභවයන් ඔස්සේ ලබන ඉපැයීම් රාජ්‍ය ආදායම ලෙස හඳුන්වයි.

## රාජ්‍ය ආදායමේ මූලික ප්‍රභේද

- බදු ආදායම
- බදු නොවන වෙනත් ආදායම්
    - පොලී රාජ්‍ය ව්‍යවසායකයන්ගේ ලාභ
    - බලපත්‍ර ගාස්තු
    - දඩ මුදල්
    - සමාජ සංරක්ෂණ දායක මුදල්
    - ප්‍රාග්ධන භාණ්ඩ විකිණුම්
    - මුද්දර ගාස්තු

## බද්දක් යනු

පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් අනිවාර්යයෙන් ගෙවිය යුතු යැයි රජය හෝ රජයේ බලධාරී ආයතනයක් විසින් නියම කරනු ලබන අනිවාර්ය ගෙවීමයි.

✓ බදු වර්ගීකරණය
බදු පදනම මත
බදු බර විතැන් කිරීමේ පදනම මත

| **බදු පදනම මත** | **බදු බර විතැන් කිරීමේ පදනම මත** |
|---|---|
| • **අනුක්‍රමික බදු**<br>ආදායම ඉහළ යන විට බදු ප්‍රතිශතයද ඉහළ යන ආකාරයෙන් අය කරනු ලබන බදු<br>උදා:- ආදායම් බදු, සමාගම් බදු<br><br>• **ප්‍රතික්‍රමික බදු**<br>ආදායම් ඉහළ යන විට බදු ප්‍රතිශතය පහළ යන අයුරින් අය කරන බදු | • **ඍජු බදු**<br>විතැන් කළ නොහැකි ආදායම්, වත්කම්, හා ධනය මත පුද්ගලයන්ගෙන් හා ව්‍යාපාරයන්ගෙන් අය කරන බදු.<br>(මේවා උද්ධමනය සඳහා ඍජු බලපෑමක් ඇති නොකරයි)<br>උදා:- ආදායම් බදු, සමාගම් බදු, පොලී බදු, උපයනවිට ගෙවීමෙ බදු, ආර්ථික සේවා ගාස්තු, වටිපනම් බදු, |

| | |
|---|---|
| උදා:- නිෂ්පාදන බදු, ඛනිජ තෙල් බදු<br><br>• **සමානුපාතික බදු**<br>ආදායම ඉහළ ගියද පහළ ගියද බදු ප්‍රතිශතය නොවෙනස්ව පවතින බදු<br>උදා:- රේගු බදු,සෙස් බදු, වරිපනම් බදු | හර බදු, ප්‍රාග්ධන ලාභ බදු, විශේෂ වෙළද භාණ්ඩ බදු, ආදායම් බලපත්‍ර බදු<br><br>• **වක්‍ර බදු**<br>විතැන් කළ හැකි භාණ්ඩ හා සේවා පදනම් කර ගනිමින් ව්‍යාපාරවලින් අය කරන බදු<br>උදා:- එඇට්, රේගු බදු, සෙස් බදු, ණ්ඹීඨ් බදු, නිෂ්පාදන බදු, විශේෂ වෙළද භාණ්ඩ බදු. |

- ✓ බදු මගින් රාජ්‍ය පරිපාලන ක්‍රියාදාමය හැරුණු විට වර්තමාන සමාජය රජයෙන් අපේක්ෂා කරන බලාපොරොත්තු
  - අය කරනු ලබන බදුමගින් ආර්ථිකයේ කාර්යක්ෂමතාව වර්ධනය කර ගනු ඇතැයි අපේක්ෂාව
  - සමාජයේ ආදායම් සාධාරණ ලෙස බෙදීයාම තහවුරු කරනු ඇතැයි අපේක්ෂාව

- ✓ රජයට බදු අවශ්‍ය වීමට හේතු
  - රාජ්‍ය ආදායම තහවුරු කර ගැනීම සදහා
  - රාජ්‍ය වියදම් පියවා ගැනීම සදහා
  - ආර්ථික පරිපාලන කටයුතු සදහා
  - ආදායම් බෙදීයාමේ විෂමතාවයන් අවම කිරීම සදහා
  - යටිතල පහසුකම් සංසංවර්ධනය සදහා
  - දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගැනීම සදහා

**මූල්‍ය ප්‍රතිපත්තිය ව්‍යාපාරවලට බලපාන ආකාරය**

- බැංකු පොලී අනුපාතය පහත හෙළීම තුළින් ව්‍යාපාරිකයන් අවම පොලී යටතේ ණය ලබා ගැනීමෙන් ව්‍යාපාර කටයුතු වර්ධනය
- වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගත යුතු සංචිත ප්‍රමාණය අඩු කළ විට වාණිජ බැංකුවල ණය සැපයීම සදහා වෙන් කළ හැකි මුදල් ප්‍රමාණය වැඩිවන නිසා ව්‍යාපාරිකයන්ට පහසුවෙන් ණය ලබා ගැනීමට හැකිවීම තුළින් ආයෝජන වැඩි වේ. ඒ තුළින් නිෂ්පාදන වැඩි වී භාණ්ඩවල මිල අඩු වේ. මිල අඩු වීම නිසා ව්‍යාපාරවල පිරිවැටුප වැඩි වී ලාභය වැඩි වේ.

**ෆිස්කල් ප්‍රතිපත්තිය ව්‍යාපාරවලට බලපාන ආකාරය**

- ව්‍යාපාරවලින් අය කරන බදු ආදායම රජය යටිතල පහසුකම් සංවර්ධනය සදහා යෙදවීම
- ව්‍යාපාර සදහා වෙන් කරන වියදම් නිසා ව්‍යාපාර වර්ධනය වීම

- ආනයන මත පනවන ඇතැම් බදු නිසා දේශීය කර්මාන්ත/ නිෂ්පාදන ආරක්ෂා වීම
- නිෂ්පාදිත මත විවිධ වර්ගයේ බදු පැනවීම නිසා භාණ්ඩ මිල ඉහළ යාමෙන් අලෙවිය අඩු වීම.

✓ රජය විසින් පනවන විවිධ බදු ව්‍යාපාර කෙරෙහි විවිධ ආකාරයේ බලපෑම් ඇති කරයි.

- බදු නිසා භාණ්ඩ හා සේවාවල මිල වැඩිවන හෙයින් ඉල්ලුම අඩුවීම හේතුවෙන් විකිණුම් අඩු වී ලාභ අඩු විය හැකිය.
- යෙදවුම්වල මිල ගණන් වැඩිවීම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යා හැකිය.
  සෘජු බදු නිසා ව්‍යාපාර ලාභ අඩු වී, ප්‍රතිආයෝජන අඩු වී, අයිතිකරුවන්ට ලැබෙන ආයෝජන අඩු වී, ඔවුන් අධෛර්යමත් වේ.
- වක්‍ර බදු පිළිබඳ ගණුදෙනු ව්‍යාපාරිකයන් විසින් අයකළ යුතු අතර ඒ සඳහා අතිරේක වියදමක් හා කාලයක් වැය වීම.

✓ බදු දිරිගැන්වීම්

- බදු නිදහස් කිරීම - බදු ඉවත් කිරීම
- බදු විරාම - කිසියම් කාලයක් තුළ බදු අය නොකිරීම
- බදු සහන - බදු ප්‍රතිශතයන් අඩු කිරීම
- බදු ප්‍රතිපාදන - අයකළ බදු නැවත ලබා දීම

✓ බදු දිරිගැන්වීම තුළින් අපේක්ෂා කරන දේ

- ආයෝජන වර්ධනය කිරීම
- විදේශ සෘජු ආයෝජන කැඳවීම
- අපනයන දිරිමත් කිරීම
- විදේශ විනිමය ඉපැයුම් වර්ධනය
- රැකියා අවස්ථා වර්ධනය
- රටේ නිෂ්පාදන වර්ධනය කර ගැනීම
- සමබර ආර්ථික වර්ධනය ඇති කිරීම

**විවිධ බදු වර්ග සහ රැස්කරන ආයතන**

✓ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

- පුද්ගල ආදායම් බදු
- සමාගම් බදු
- ලාභාංශ බදු

- මුද්දර බදු
- ආර්ථික සේවා ගාස්තු

✓ සුරාබදු දෙපාර්තමේන්තුව
- මත්පැන් රා අරක්කු සදහා වූ නිෂ්පාදන බදු

✓ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව
- රේගු බදු
- වරාය හා ගුවන්තොටුපොල බදු
- තීරු බදු අධිභාරය
- සංවර්ධන බදු

✓ මෝටරරථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
- මෝටරරථ ලියාපදිංචි බදු
- රථ මාදිලි වෙනස් කිරීමේ බදු
- පැවරුම් බදු
- සුඛෝපභෝගී මෝටරරථ බදු

✓ පලාත් සභාව
- මෝටරරථ ආදායම් බලපත්‍ර ගාස්තු

✓ පලාත් පාලන ආයතන
- වරිපනම් බදු
- විනෝද බදු

**විවිධ බදු වර්ග**

✓ එකතු කළ අගය මත බද්ද
ආනයනයේදී, නිෂ්පාදනයේදී හා වෙළදාමේදී භාණ්ඩ
හා සේවාවන්ගෙන් ආර්ථිකයට අලුතින් එකතුවන වටිනාකම මත අය කරන බද්දකි. මෙය වක්‍ර බද්දකි.

✓ සමාගම් බදු
සමාගම් උපයන ලාභය මත කරන බද්දකි. මෙය සෘජු බද්දකි.

✓ රේගු/තීරු බදු
ආනයනයේදී හා අපනයනයේදී අය කරනු ලබන බද්දකි. වක්‍ර බද්දකි.

✓ පරිසර ආරක්ෂණ බදු
පරිසරය සුරැකීම සදහා හදුනාගත් වෘත්තීන් මත අය කරනු ලබන බද්දකි. වක්‍ර බද්දකි.

- ✓ වරිපනම් බදු
  නිශ්චල දේපළ මත අය කරනු ලබන බද්දකි. සෘජු බද්දකි.

- ✓ හර බද්ද
  තැන්පත්කරුවන් විසින් ගිණුම්වල ඇති මුදල් ඉවත් කර ගැනීමේදී අය කරනු ලබන බද්දකි. සෘජු බද්දකි.

- ✓ ආදායම් බදු
  පුද්ගලයින්ගේ ආදායම් පදනම් කර ගනිමින් අය කරනු ලබන බද්දකි.

- ✓ ප්‍රග්ධන ලාභ බදු
  ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන ලාභ මත අය කරනු ලබන බද්දකි. සෘජු බද්දකි.

- ✓ සෙස් බදු
  කිසියම් කර්මාන්තයක් ආරක්ෂා කිරීමට හා වර්ධනය කිරීමට අය කරනු ලබන බද්දකි. වක්‍ර බද්දකි.

- ✓ නිෂ්පාදන බදු
  දේශීය වශයෙන් නිපදවන මත්පැන්/ දුම්කොළ ඉන්ධන මත අය කරන බද්දකි. වක්‍ර බද්දකි.

✓ බදු ආදායමට වැඩිම දායකත්වයන්,
- නිෂ්පාදන බදු
- ආදායම් බදු
- එකතු කළ අගය මත බද්ද

✓ වර්තමානයේ භාවිතය තුළ නොමති බදු
- හර බදු
- පිරිවැටුම් බදු

✓ වර්තමානයේ රජය හදුන්වා දීමට උත්සහ දරන නවතම බදු වර්ග
- කාබන් බද්ද
- ප්‍රග්ධන ලාභ බද්ද
- මූල්‍ය ගණුදෙනු ගාස්තු

## රාජ්‍ය වියදම

යම් මුදල් වර්ෂයකට අදාළ ව රජය විසින් සිදු කරනු ලබන සියළුම වැය කිරීම් වේ.

| ප්‍රාග්ධන වියදම් | වර්තන වියදම්/පුනරාවර්ථන වියදම් |
|---|---|
| • දිගු කාලීන ආයෝජන සඳහා රජය දරන වියදම්<br>• දිගු කාලීන වේ<br>• නිදසුන්<br>○ ස්ථාවර (මූර්ත) වත්කම් අතත් කර ගැනීම<br>○ ප්‍රාග්ධන් පැවරුම්<br>○ ස්ථාවර වත්කම් පුනුරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | • රාජ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා රජය දරන වියදම්<br>• කෙටි කාලීන වේ<br>• නිදසුන්<br>○ භාණ්ඩ හා සේවා සඳහා වියදම්<br>○ පොලී ගෙවීම<br>○ වර්තන පැවරුම් හා සහනාධාර |

### ව්‍යාපාර සඳහා රජය සපයන පහසුකම්

| සේවා වර්ග | සේවා සපයන ආයතන |
|---|---|
| මූල්‍ය සේවා | ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව<br>රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වාණිජ බැංකු<br>ප්‍රාදේශීය සංවර්ධන බැංකු<br>සර්වෝදය බැංකු සංගම් |
| උපදේශන සේවා | ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව ආයතනය<br>කාර්මික සංවර්ධන මණ්ඩලය<br>අපනයන සංවර්ධන මණ්ඩලය<br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය<br>ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය |
| යටිතල පහසුකම් | ශ්‍රී ලංකා ආයෝජන මණඩලය<br>ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය<br>කාර්මික සංවර්ධන මණ්ඩලය<br>ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන |
| අලෙවි සේවා | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය<br>අපනයන සංවර්ධන මණ්ඩලය<br>ජාතික ශිල්ප සභාව<br>කාර්මික සංවර්ධන මණ්ඩලය |
| තාක්ෂණික සේවා | කාර්මික සංවර්ධන මණ්ඩලය<br>කාර්මික තාක්ෂණ ආයතන |

| | |
|---|---|
| | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය<br>ශ්‍රී ලංකා මෝස්තර මධ්‍යස්ථානය<br>ජාතික ඇසුරුම් මධ්‍යස්ථාන<br>ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය |

**බුද්ධිමය දේපළ**

- පුද්ගලයෙකු තම බුද්ධිය මෙහෙයවා සිදු කරන නිර්මාණයන්
- බුද්ධිමය දේපළ අයිතිය බුද්ධිමය දේපළ සඳහා ලබාදෙන නෛතික රැකවරණයයි.

**බුද්ධිමය දේපළ නීතිය**

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත

- ✓ බුද්ධිමය දේපළ ආයතනය
  බුද්ධිමය දේපළ කාර්යංශය

- ✓ බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් වගකීම් දරණ රාජ්‍ය නිළධාරියා
  බුද්ධිමය දේපළ අධ්‍යක්ෂක ජෙනාල්වරයා

- ✓ බුද්ධිමය දේපල අයිතීන් වර්ග
  - ✓ පේටන්ට් අයිතිය
    - මුල් නිෂ්පාදන / නව සොයාගැනීම් සඳහා අදාළ පාර්ශවයන්ට රජය විසින් ලබා දෙන සහතිකයයි. ස්වාධිකාර හිමිකම් ලෙසද හඳුන්වයි.
    - වසර 20ක් දක්වා වලංගු වන අතර නැවත අළුත් කළ නොහැක.
    - ස්වාධිකාර හිමකම් ලබා ගත නොහැකි නව සොයාගැනීම්
      - ඖෂධ පනත
      - නව ප්‍රතිකාර ක්‍රම සඳහා
      - පැලෑටි වර්ග

  - ✓ ප්‍රකාශන අයිතිය
    - මුල් ශාස්ත්‍රීය කෘතීන් මීට අදාල වේ.
    - එනම් පොත්, ලිපි, පරිඝනක මෘදුකාංග, වේදිකා නාට්‍ය, චිත්‍ර, මූර්ති, සංගීතය, චිත්‍රපට වැනි නිර්මාණ මීට අදාළය.
    - මෙහි වලංගුතාවය කතෘ ජීවත්වන තුරු හා ඔහුගේ මරණින් පසු වසර 70ක් දක්වා පමණි.

- දීර්ඝ කළ නොහැක.

✓ කාර්මික සැලසුම්
- යම් භාණ්ඩයකට නව පෙනුමක් ලබාදීම හෝ නව මෝස්තරයක් පිළිබඳව හිමිවන සහතිකය මෙය වේ.
- අයිතිය වසර 5කට හිමිවේ.
- ගාස්තු ගෙවා දීර්ඝ කළ හැකිය.

✓ වෙළඳ ලකුණ
- යමෙකුගේ වෙළඳ හා සේවා ලකුණු පිළිබඳ වූ අයිතිය වෙළඳ ලකුණයි.
- මෙය යම්කිසි පදයක්, සළකුණක් හෝ ලාංඡනයක් විය හැකිය.
- මෙය වසර 10කට වලංගු වේ.
- තවදුරටත් වසර 10 බැගින් දීර්ඝ කරගත හැකිය.

**භූගෝලීය දර්ශක**
- ප්‍රදේශයක අනන්‍යතාවය හා උරුමය එම ප්‍රදේශයට පමණක් උරුම කරදීමේ සහතිකය මෙයයි.
- නිදසුන්
  - සිලෝන් ටී ශ්‍රී ලංකාව
  - රුහුණු මී කිරි එම ප්‍රදේශයට පමණි.

❖ දීර්ඝ කළ නොහැකි බුද්ධිමය අයිතිවාසිකම්
- පේටන්ට් අයිතිය
- ප්‍රකාශන අයිතිය

❖ දීර්ඝ කල හැකි අයිතිවාසිකම්
- කාර්මික සැලසුම්
- වෙළඳ ලකුණ

❖ කාල සීමාවක් පනවා නැති බුද්ධිමය දේපල අයිතිවාසිකම
- භූගෝලීය දර්ශක

## පාරිභෝගික ආරක්ෂණය

පාරිභෝගිකයා ගෙවන මුදලට ප්‍රමාණවත් තෘප්තියක් ලබා දීම සහතික කිරීම පිණිස සලසා ඇති නීතිමය ආවරණයයි.

- ❖ අන්තර් ජාතික පාරිභෝගික දිනය
  මාර්තු 15

- ❖ පාරිභෝගික ආරක්ෂණයේ ප්‍රධාන අපේක්ෂාව
  පාරිභෝගිකයන් විසින් ගෙවන මුදලට සරිලන තෘප්තියක් සහතික කර දීම

- ❖ පාරිභෝගික ආරක්ෂණය සඳහා ස්ථාපිත නීතිය
  2003 අංක 9 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

- ❖ පාරිභෝගිකයා
  ප්‍රතිෂ්ඨාවක් ගෙවා අත්පත් කරගෙන සත්‍ය වශයෙන්ම පාරිභෝජනයේ යෙදෙන්නෙකු හෝ පාරිභෝජනයේ යෙදවී යැයි විශ්වාසය තැබිය හැකි තැනැත්තෙක් වේ.

### පාරිභෝගික ආරක්ෂ්ණයේ අවශ්‍යතාව

- ව්‍යාපාර තරගකාරීත්වය
- ගෝලියකරණයේ බලපෑම
- දැඩි ප්‍රවර්ධන ක්‍රම
- එකම වුවමනාව සපුරා ගැනීමට විවිධ වර්ගයේ භාණ්ඩ පැවතීම
- නව තාක්ෂණික භාණ්ඩ වෙළඳපොළට එක්වීම
- පාරිභෝගිකයන්ගේ වැය කළ හැකි ආදායම ඉහළ යෑම
- ශක්තිමත් පාරිභෝගික සංවිධාන හිගකම
- පාරිභෝගික අධ්‍යාපනය දුර්වල වීම
- නිදහස් වෙළඳාම

### පාරිභෝගික ආරක්ෂණය සැලසෙන ක්‍රම

- අණපනත් හා රාජ්‍ය ආයතන
- ස්වයං ආරක්ෂාව
- පාරිභෝගික සංවිධාන

- ❖ පරිභෝගිකයා විසින් ම තම ආරක්ෂාව සායා ගැනීම අනෙකුත් ආරක්ෂාවන්ට වඩා වැදගත් ආරක්ෂාවකි.
- ❖ පාරිභෝගිකයා විසින්ම තම ආරක්ෂාව සලසා ගන්නා නිසා යම් හානියක් හෝ අලාභයක් සිදුවීමට පෙර ඉන් ආරක්ෂා වීමට ඉඩකඩ සැලසේ.

## පාරිභෝගික ආරක්ෂණයට දායකත්වය

- පාරිභෝගික සහභාගීත්වය
  - ප්‍රමිති ලාංඡන සහිත භාණ්ඩ මිලට ගැනීම
  - ලේබල් පරීක්ෂා කර භාණ්ඩ මිලදී ගැනීම
  - ප්‍රකට සන්නම් නාමයක් හෝ වෙළඳ ලකුණක් සහිත භාණ්ඩ මිලදී ගැනීම
  - පාරිභෝගික සංවිධාන පිහිටුවීම
  - පාරිභෝගික අධ්‍යාපනය වර්ධනය කර ගැනීම
  - විශ්වාසවන්ත ස්ථානවලින් භාණ්ඩ මිලදී ගැනීම

- ව්‍යාපාරවල සහභාගීත්වය
  - ආචාරධර්ම පද්ධතියක් ක්‍රියාත්මක කිරීම
  - පාරිභෝගිකයා සඳහා වූ සමාජ වගකීම් ඉටු කිරීම
  - පාරිභෝගික ආරක්ෂණ නීතිරීති ආරක්ෂා කිරීම
  - අලෙවිකරණ ආචාරධර්ම ඉටු කිරීම
  - පාරිභෝගික ආරක්ෂණ ජාතික වැඩසටහන් සඳහා සහය වීම

- රජය සහභාගීත්වය
  - ශක්තිමත් පාරිභෝගික ආරක්ෂණ නීතිරීති පිහිටුවීම
  - පාරිභෝගික ආරක්ෂණ සඳහා වූ ආයතන පිහිටුවීම
  - අකාර්යක්ෂම පාරිභෝගික ආරක්ෂණ නීතිරීති අවලංගු කිරීම
  - පාරිභෝගික ආරක්ෂණයට අදාළ අකාර්යක්ෂම ආයතන වසා දැමීම
  - පාරිභෝගික අධ්‍යාපනය ඉහළ නැංවීමට කටයුතු කිරීම
  - පාරිභෝගික ආරක්ෂණයට අවශ්‍ය අරමුදල් සැපයීම

## පාරිභෝගික සංවිධාන

- පාරිභෝගික ආරක්ෂණය සලසා ගැනීම සඳහා පරිභෝගිකයින් විසින් පිහිටුවා ගන්නා ලද ස්වේච්ඡා සංවිධානයන් වේ.
- අවම සාමජික සංඛ්‍යාව 15කි.
- පිහිටුවන ලබන බලප්‍රදේශ
  - ග්‍රාමසේවා බලප්‍රදේශ
  - නාගරික බලප්‍රදේශ

## පාරිභෝගික ආරක්ෂණයේ මට්ටම්

- ස්වයං මට්ටම්
- ප්‍රාදේශීය මට්ටම්
- ජාතික මට්ටම්
- අන්තර්ජාතික මට්ටම්

## පාරිභෝගික අධ්‍යාපනය

පාරිභෝගික අයිතිවාසිකම් හා පාරිභෝගික වගකීම් පිළිබඳව පාරිභෝගිකයන්ගේ දැනුම, කුසලතාවයන් හා ආකල්ප වැඩි දියුණු කිරීමයි.

❖ පාරිභෝගික අධ්‍යාපනය මගින් පාරිභෝගික ආරක්ෂණය සැලසෙන ආකාර 02ක් නම්,

- ස්වයං ආරක්ෂාව මගින්
- අනෙකුත් පාරිභෝගිකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම මගින්

## පාරිභෝගික අයිතිවාසිකම්

ගෙවන මුදලට සාධාරණ තෘප්තියක් ලැබීම තහවුරු කිරීම සඳහා පාරිභෝගිකයා වෙත ප්‍රකාශ කර ඇති හිමිකමයි.

❖ පාරිභෝගික අයිතිවාසිකම්

- ජෝන් එෆ් කෙනඩි
  - ආරක්ෂාව සලසා ගැනීමේ අයිතිය
  - තොරතුරු දැන ගැනීමේ අයිතිය
  - තෝරා ගැනීමේ අයිතිය
  - සවන් යොමු කරවා ගැනීමේ අයිතිය
- පාරිභෝගික ජාත්‍යන්තරය
  - මූලික අවශ්‍යතා සපුරා ගැනීමේ අයිතිය
  - වන්දි ලබා ගැනීමේ අයිතිය
  - පාරිභෝගික අධ්‍යාපනය පිළිබඳ අයිතිය
  - සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත්වීමේ අයිතිය

## පාරිභෝගික වගකීම්

- පාරිභෝගික අයිතිවාසිකම් රැක ගැනීමට පාරිභෝගිකයා තුළ වූ බැඳියාව හෝ ඒ සඳහා සංවිධාන ගතව කටයුතු කිරීම
  - විචාරශීලී අවබෝධය
  - ක්‍රියාකාරී සහභාගීත්වය
  - සමාජය පිළිබඳ සැලකිල්ල
  - පාරිසරික දැනුවත්බව
  - සහයෝගීතාවය/ සහභාගීත්වය

## පාරිභෝගික ආරක්ෂණයට සම්බන්ධ මූලික ආයතන ද්විත්වය

- දේශීය පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
- විදේශීය පාරිභෝගික ජාත්‍යන්තරය

**පාරිභෝගික ආරක්ෂණයට අදාළ**

- විදේශීය ආයතන
  - පාරිභෝගික ජාත්‍යන්තරය
  - අන්තර්ජාතික ප්‍රමිති සංවිධානය
  - එක්සත් ජාතීන්ගේ සංවිධානය
- දේශීය ආයතන
  - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
  - පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව
  - ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
  - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
  - මධ්‍යම පරිසර අධිකාරිය
  - පළාත් පාලන ආයතන
  - මිනුම් ඒකක සහ සේවා දෙපාර්තමේන්තුව
  - ජාතික ඖෂධ අධිකාරිය

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

- ස්ථාපිත කළ නීතිය
  - 2003 අංක 9 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

- නිලධාරී ව්‍යුහය
  - අධිකාරියේ සභාපති
  - අදිකාරිය අද්‍යක්ෂ ජනරාල්
  - යම් යම් විෂයන්හි පළපුරුද්ද සහිත නිලධාරීන් 10 ක් ඉක්ම වූ පිරිසක්

- ඒකාබද්ධ කළ ආයතන
  - සාධාරණ වෙළඳාම පිළිබඳ කොමිෂන් සභාව
  - අභ්‍යන්තර වෙළඳ පිළිබඳ කොමසාරිස් දෙපාර්තමේන්තුව

- කාර්‍යයන්
  - අසාධාරණ වෙළඳ පිළිවෙත් වැළැක්වීම
  - ඒකාධිකාරී තත්ත්වයන් පාලනය කිරීම
  - තරඟ විරෝධී චර්යා පාලනය
  - පාරිභෝගික සංවිධාන පිහිටුවීමට අනුග්‍රහය දැක්වීම
  - පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
  - තරගකාරී මිල ප්‍රවර්ධනය

❖ බලතල
- මිල ලකුණු කිරීම ලේබල් කිරීම ඇසිරීම විකිණීම සම්බන්ධ නියෝග නිකුත් කිරීම
- භාණ්ඩ හා සේවා වල ප්‍රමිතිය පිළිබඳ නියෝග නිකුත් කිරීම
- වෙළඳ පරිශ්‍රයන්ට ඇතුළුවීම හා පරීක්ෂා කිරීම
- දඩ නියම කිරීම හා භාණ්ඩ රාජසන්තක කිරීම
- තොරතුරු සපයන ලෙස ඉල්ලා සිටීම

❖ අරමුණු
- උපද්‍රවකාරී භාණ්ඩවලින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම
- අසාධාරණ වත් පිළිවෙත් වලින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම
- තරගකාරී මිලකට මිලට ගැනීමට ඉඩකඩ සැලසීම
- පාරිභෝගික සුරාකෑම එරෙහිව සහනයක් ලබාදීම

**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**

- පාලනය
  මහා මණ්ඩලයක් විසිනි

- ස්ථාපිත කළ නීතිය
  1984 අංක 6 දරණ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත

- ව්‍යුහය
  අමාත්‍යවරයා විසින් පත් කළ සාමාජිකයින් 11 ක් සහිත මහා මණ්ඩලය

- අයත් අමාත්‍යාංශය
  විද්‍යා හා තාක්ෂණ අමාත්‍යංශය

- අරමුණු
  - ජාතික හා අන්තර්ජාතික පදනම මත ප්‍රමිත පිළියෙල කිරීම
  - ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය ප්‍රවර්ධනය
  - රසායනාගාර හා පුස්තකාල සේවා පවත්වාගෙන යාම
  - ප්‍රමිති සහතික ලකුණු ක්‍රමය ක්‍රියාත්මක කිරීම

- කාර්යභාරය
  - ප්‍රමිති සංවර්ධනය
  - නිෂ්පාදන සහතික කිරීම
  - පරීක්ෂණාගාර සේවා
  - ශ්‍රී ලංකා ජාතික තත්ත්ව සම්මානය පිරිනැමීම

- ආනයන භාණ්ඩ පරීක්ෂාව
- පූර්ව අපනයන පරීක්ෂාව
- පරීක්ෂාගාර සේවා ශ්‍රී
- තත්ත්ව පද්ධති පිළිබඳ අන්තර්ජාතික ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම
- විදුලි උපකරණ වල ශක්ති කාර්යක්ෂමතා ලේබල්කරණය ක්‍රියාත්මක කිරීම
- පාරිභෝගික අධ්‍යාපනය ප්‍රචලිත කිරීම

**පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව**

- ස්ථාපිත කළ නීතිය
  පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත

- නිලධාරී සංයුතිය
  වාණිජ නීති ක්ෂේත්‍රයේ පුළුල් පළපුරුද්දක් ඇති තැනැත්තෙක්
  ව්‍යාපාර කළමනාකරණයේ පළපුරුද්ද ඇති තැනැත්තෙක්
  වෙළඳ පිළිවෙත් හා පාරිභෝගික කටයුතු වල පුළුල් පළපුරුද්දක් ඇති තැනැත්තෙක්

- කාර්යභාරය
  තරඟ විරෝධී චර්යා සම්බන්ධයෙන් විමර්ශනය කිරීම පැමිණිලි විභාග කිරීම සිදු කරයි

❖ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් ප්‍රකාශ කර ඇති නිශ්චිත භාණ්ඩ
වියලි මිරිස්, ලොකු ලූනු, මුං ඇට, පරිප්පු, ගෑස්, හාල්මැස්සො, සහල්, තිරිඟු පිටි, සිමෙන්ති, රතු ලූනු, සුදු සීනි, කඩල, කුකුල් මස්, සැමන්, කිරිපිටි

❖ ආහාර සම්බන්ධ ආයතන
- ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
- ආහාර විද්‍යා අංශය

❖ ඖෂධ සම්බන්ධ ආයතන
- රාජ්‍ය ඖෂධ සංස්ථාව
- රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව
- අන්තරායකර ඖෂධ පාලන අධිකාරිය

❖ **පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත**
පාරිභෝගික ආරක්ෂාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධානතම නීතියයි

❖ අධිකාරි පනත සම්මත වීමේදී අහෝසි වූ පනත්
- පාරිභෝගික ආරක්ෂණ පනත
- සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත
- මිල පාලන පනත

**අධිකාරී පනත ට අනුව වෙළඳ සිදුකරන වැරදි**
- ○ භාණ්ඩවල මිල ලේබල් කිරීම පැහැර හැරීම හා මිල ලකුණු නොකිරීම
- ○ ඇසුරුම් හා නිෂ්පාදන සම්බන්ධ නියෝග පැහැර හැරීම
- ○ භාණ්ඩවල ලේබල් විස්තර වෙනස් කිරීම මකා දැමීම විකෘති කිරීම හෝ ඉරා දැමීම
- ○ ලකුණු කළ මිලට වඩා ඉහළ මිලකට භාණ්ඩ විකිණීම
- ○ විකිණීමට තබා ඇති භාණ්ඩ විකිණීම ප්‍රතික්ෂේප කිරීම
- ○ මිල දර්ශනය ප්‍රදර්ශනය නොකිරීම
- ○ පාරිභෝගිකයන් නොමඟ යැවීම
- ○ පමණට වඩා වැඩියෙන් භාණ්ඩ රැස්කර තබා ගැනීම
- ○ ගැනුම්කරු ඉල්ලා සිටින විට කුවිතාන්සි නිකුත් නොකිරීම

❖ ආහාර පනත ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා
සෞඛ්‍ය හා සේවා අධ්‍යක්ෂ ජනරාල් වරයා

❖ ආහාර පනත යටතේ ස්ථාපිත කමිටුව
ආහාර උපදේශන කමිටුව

❖ පාරිභෝගික අධිකාරි පනත ට අනුව කුවිතාන්සිය ක ඇතුලත් විය යුතු කරුණු
- අලෙවි කළ දිනය
- ගෙවන ලද මිල
- භාණ්ඩ ප්‍රමාණය
- ගනුදෙනුවේ ස්වභාවය
- (විකිණීමක් සිදුවන සෑම විටම කුවිතාන්සියක් නිකුත් කිරීම අනිවාර්ය නොවන අතර ගනුදෙනුකරු ඉල්ලා සිටින විට පමණක් වූ කාසි නිකුත් කළ යුතුය )

❖ ලේබලයක ඇතුලත් විය යුතු කරුණු
- උපරිම සිල්ලර මිල
- නිෂ්පාදිත දිනය
- කල් ඉකුත්වන දිනය

- නිෂ්පාදන කාණ්ඩ අංකය
- බර හෝ පරිමාව

**ප්‍රමිති හා ප්‍රමිතිකරණය**

- ප්‍රමිතිකරණයේ මූලික අංග
  - ප්‍රමිත සකස් කිරීම
  - ප්‍රමිති නිකුත් කිරීම
  - ප්‍රමිති ක්‍රියාත්මක කිරීම

- අරමුණු
  - රටක සමස්ත ආර්ථික වර්ධනය
  - පාරිභෝගික ආරක්ෂාව
  - පාරිභෝගික සෞඛ්‍ය ආරක්ෂාව
  - සන්දේශන වර්ධනය

- ප්‍රතිලාභ
  - නාස්ති අවමවීම
  - ගෙවන මිලට සාධාරණ වටිනාකමක් ලබාදීම
  - නිෂ්පාදිත ගුණත්වය වර්ධනය
  - පාරිභෝගික ජීවන තත්වය උසස් කිරීම
  - අන්තර්ජාතික වෙළදාම දියුණු වීම
  - ඉහළ පිළිගැනීම

- ගෝලීය ප්‍රමිත දිනය
  ඔක්තෝබර් 14

- ප්‍රමිතිකරණයේ මට්ටම්
  - අන්තර්ජාතික ප්‍රමිති
    සමස්ත ලෝකයම භාවිතා කරන ජාත්‍යන්තර සංවිධාන විසින්සකස් කරයි
  - කලාපීය ප්‍රමිති
    රටවල් කිහිපයක් එක් වී සකස් කරනු ලබයි
  - ජාතික ප්‍රමිති
    රටක ප්‍රමිති ආයතනය විසින් සකස් කරන ප්‍රමිති
  - කර්මාන්ත ප්‍රමිති
    සමස්ත කර්මාන්තයම අනුගමනය කරන ප්‍රමිති
  - සමාගම් ප්‍රමිති
    ආයතන විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රමිති
  - පුද්ගල ප්‍රමිති
    පෞද්ගලිකව සකස් කරනු ලබන ප්‍රමිති

## ප්‍රමිති ආයතනය ජාතික ප්‍රමිති ක්‍රියාත්මක කරන ආකාරය

- ස්වෙච්ඡාවෙන් පිළිපැදීම මගින්
  ප්‍රමිත වලට අනුකූලව භාණ්ඩ නිෂ්පාදනය බලපෑමක් නොමැතිව නිශ්පාදකයා කැමැත්තෙන්ම සිදුකරනු ලබයි

- එස් එල් එස් භාණ්ඩ සහතිකකරණය මගින්
  මෙය ආකාර දෙකකින් ක්‍රියාත්මක වේ.
  ස්වෙච්ඡාවෙන් ක්‍රියාත්මක වන සහතික ලාංඡන ක්‍රමය
  නියමිත භාණ්ඩ කිහිපයකට සහතික ලාංඡන අනිවාර්ය කිරීම

- පූර්ව අපනයන පරීක්ෂාව මගින්
  කෘෂි නිෂ්පාදන අපනයනය කිරීමට පෙර ස්වේච්ඡා පදනමෙන් ප්‍රමිති ආයතනයේ සිදුකරගන්නා පරීක්ෂාවයි

- ආනයන පරීක්ෂාව මගින්
  රටට ආනයනය කරන භාණ්ඩ වෙළෙඳ පොළට නිකුත් කිරීමට පෙර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් සිදු කරගත යුතු පරීක්ෂාවයි

- අපනයනය සඳහා මුහුදු ආහාර පැසුරුම් ආයතන පරීක්ෂාව මගින්
  මුහුදු ආහාර අපනයනය සඳහා අවශ්‍ය සෞඛ්‍ය සහතික ලබාගැනීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ලබා ගත යුතු ඇසුරුම්කරණ ඇසුරුම් පරීක්ෂාවයි

❖ එස් එල් එස් සහතිකකරණය
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රමිති පිරිවිතරයන්ට අනුව නිෂ්පාදනය කර ඇති බව

❖ ඕ එච් එස් එ එස් 18001 2007
වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති සහතිකකරණය

❖ අයි එස් ඕ 22000 2005
ආහාර ආරක්ෂණ කලමනාකරණ පද්ධති සහතිකකරණය

❖ එච් එ සී සී පි සහතිකකරණය
ආහාර නිෂ්පාදන වල සෞඛ්‍ය ආරක්ෂිත බව සහතිකකරණය උපද්‍රව අවධි පාලන අවස්ථා විශ්ලේෂණය

❖ ශක්ති කාර්යක්ෂමතා ලේබලය
විදුලි බල පරිභෝජන කාර්යක්ශම උපකරණ සඳහා ලබා දෙන ලේබලය

❖ ජීඑම්පී සහතිකය
යහපත් නිෂ්පාදන පිළිවෙත් සහතිකකරණය ඖෂධ සඳහා අනිවාර්ය වේ

- අයි එස් ඕ 9001 2008
  තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකකරණය

- අයි එස් ඕ 14001 2004
  පරිසර කලමනාකරණ පද්ධති සහතිකකරණය

- අයි එස් ඕ 50001 2011
  බලශක්ති කළමනාකරණ පද්ධති සහතිකකරණය

- අයි එස් ඕ 27001 2005
  තොරතුරු කලමනාකරණ පද්ධති සහතිකකරණය

- අයි එස් ඕ 26000 2010
  සමාජ වගකීම් කලමනාකරණ පද්ධති සහතිකකරණය

- තේ නිපයුම් සහතිකකරණය
  උසස් ප්‍රමිතියෙන් යුතු හෝ නිෂ්පාදනයන් දිරිමත් කිරීම අරමුණු කරගෙන හඳුන්වාදී ඇති භාණ්ඩ සහතිකකරණය

- විදාතා පද්ධති සහතිකකරණය
  කුඩා පරිමාණයේ කර්මාන්ත කරුවන් සඳහා ලබාදෙන පද්ධති සහතිකකරණය

- ප්‍රමිතියක් යනු නිෂ්පාදනයෙහි වෙළඳාමෙහි පරිභෝජනයෙහි උපරිම කාර්යක්ෂමතාව සඳහා විද්‍යාවේ තාක්ෂණයේ හා පළපුරුද්ද ප්‍රතිඵල එක් කර අදාළ සියලු අංශවල සහයෝගයෙන් හා එකඟතාවයෙන් පිළියෙල හා අන්තර්ජාතික කලාපිය හා ජාතික මට්ටමේ පිළිගත් ආයතනයක් මගින් අනුමත කර මහජනයා වෙත නිකුත් කරනු ලබන තාක්ෂණික පිරිවිතරයකි

- එස් එල් එස් ලබා ගැනීමේ ක්‍රියාවලිය

    - අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම
    - පූර්ව කම්හල් පරීක්ෂාව
    - නියැදි පරීක්ෂාව
    - අවසාන පරීක්ෂාව
    - කොන්දේසි නියම කිරීම
    - එස් එල් එස් ප්‍රමිති ලාංඡන පිරිනැමීම

- එස් එල් එස් මගින් ලැබෙන ප්‍රතිලාභ
    - නිෂ්පාදකයාට
        - විකුණුම් වැඩිවීම
        - සම්පත් නාස්තිය අවම වීම
        - තරගයට සාර්ථකව මුහුණ දීම
        - ප්‍රචාරණ වියදම් අඩුවීම

- විශ්වාසය වර්ධනය වීම
- පිරිවැය අඩුවීම
- ලාභය වැඩි වීම

- පාරිභෝගිකයාට
  - තෝරා ගැනීම පහසු වීම
  - ගෙවන මුදලට සාධාරණ වටිනාකමක් ලැබීම
  - ආරක්ෂාවක් ලැබීම
  - තෙවන පාර්ශවයක් වගකීමෙන් බැඳීම
  - ගුණත්වයෙන් ඉහල භාණ්ඩ පාරිභෝජනයට ඉඩ ලැබීම

**එස් එල් එස්ලාංඡනය අනිවාර්ය ආහාර නිෂ්පාදිත**

සින්තටික් කෝඩියල්, පලතුරු රස පාන, සාර පලතුරු යුෂ, සාර පලතුරු සිරප් පාන, උකු කිරි, ටින් මාලු, නැවුම් පලතුරු ,කෝඩියල්, දුඹුරු සීනි, පිළිගැන්වීමට සූදානම් පලතුරු බීම

( දේශීය ආහාර හා අහාර නොවන නිෂ්පාදිත 34ක් සඳහා ද ආනයන නිෂ්පාදිත 123ක් සඳහා දී ළී අනිවාර්ය කර ඇත .)

**ජාතික තත්ත්ව සම්මානය**

සුළු මධ්‍ය හා මහා පරිමාණ නිෂ්පාදනයන් සිදු කරන ව්‍යාපාරිකයින්ට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් වාර්ෂිකව පිරිනමනු ලබන සම්මානයයි තත්ව පාලන වැඩ පිළිවෙත් ඇගැයීමට ලක් කරමින් නිකුත් කරයි

A/L NOTE BOOK
All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."